# ථෙරවාද අභිධර්මයේ දොළොස් අකුසල් සිත් පිළිබඳ විවරණයක්

මිරිස්වත්තේ විමලඤාණ හිමි

## 1. අරමුණ

අභිධර්මයේ දර්ශනය හා චරණය පුළුල්ව අවබෝධ කර ගැනීමට මූලාශ්‍රගත අභිධර්මය පිළබඳ විස්තරාත්මක දැනුමක් අවශ්‍ය ය. පැරණි සාම්ප්‍රදායික අභිධර්ම අධ්‍යයනයේ දි **අභිධම්මත්ථසංගහ** කෘතිය ථෙරවාද බෞද්ධ ලෝකයේ අතිශයින් ජනප්‍රිය වූ බව අපි දනිමු. **අභිධම්මත්ථසංගහ** කෘතිය සමස්ත අභිධර්මයේ විෂය ක්ෂේත්‍රය ආවරණය කරන කෘතියක් නොවූවත්[1] එය සාම්ප්‍රදායික අභිධර්ම අධ්‍යයනයේ දි ජනප්‍රිය වූයේ එමගින් අභිධර්මය ඉගෙනීමට සාර්ථක මූලික ප්‍රවේශයක් ඇති කරන නිසාවෙන් බව කිව යුතු නොවේ. පිටකාගත අභිධර්මයේ වැදගත් ම කෘතිද්වය වන ධම්මසංගණී හා පට්ඨාන යන කෘති දෙකේ හා පාලි අටුවා හා ටීකාගත අභිධර්මයේ මූලික සංකල්ප තේරුම් ගැනීමෙහි ලා **අභිධම්මත්ථසංගහ** කෘතියේ වැදගත්කම සුළුපටු නොවේ.

අභිධර්මාධ්‍යයන ප්‍රචලිත නොවන මෙවක **අභිධම්මත්ථසංගහාගත** අභිධර්මය ඉගෙනීමට අවශ්‍ය මාර්ගෝපදේශ සුලභ නැත. පසුගිය සියවසේ මෙරට වැඩ විසූ චිරප්‍රසිද්ධ අභිධර්මධර භික්ෂූන් වහන්සේලා මෙන් ම ගිහි උගතුන් විසින් **අභිධම්මත්ථසංගහ** ග්‍රන්ථයෙහි විවරණ ක්‍රමය අනුව අභිධර්මය පිළිබඳ ලියූ කෘති අතළොස්සක් තිබේ. මෙම කෘති පරිශීලනය කරන්නෙකුට වුවත් නිසි මග පෙන්වීමකින් තොරව එම කෘති හැදෑරීම අසීරුය. විශේෂයෙන්, අභිධර්මය පිළිබඳ ආධුනිකයෙකුට එම කෘති හැදෑරීමේ දි ඇතිවල මූලික

---

1 ගල්මංගොඩ, සුමනපාල, ආභිධර්මික විවරණ හා බෞද්ධ චින්තාවේ සංවර්ධනය, සරස්වතී ප්‍රකාශන, 2008. 38-39

සත්වයන්ට ප්‍රවෘත්ති විපාක (කිසියම් භවයක උපන් සතවයන්ට පෙර කළ ක්‍රියාවල විපාක) වශයෙන් ඇතිවන කාමාවචර සිත් රූප අරූප භවාංගයන්ගේ සම්බන්ධයෙන් ද මහග්ගත ජාතියෙන් ද (රූප ලෝකවල හා අරූපලෝකවල වෙසෙන සත්වයන්ගේ රූප හා අරූප තණ්හාවට අයත් නොවී හෝ අරමුණු නොවී) පහළ වේ.[4] මේ ද **අවස්ථා කාම භූමි** නම් වේ. එහෙත් අකුසල් සිත් යනු කර්ම සිත් කොටසක් වන හෙයින් එම සිත් ස්ථානභූමි වශයෙන් ඇතිවන්නේ කාමාවචර ලෝකයේ පමණි.

පසුකාලීනව දියුණු වූ අභිධර්ම සාහිත්‍ය ග්‍රන්ථවල අකුසල් සිත්වලින් මුලින්ම දක්වා ඇත්තේ ලෝභ මූලික සිත් ය. ලෝභ මූලික සිත් මුලින් ම දැක්වීමට හේතු වූ ධර්මානුකූල පදනමක් තිබිණි. ක්ෂණවාදයට අනුව පසුකාලීන ථෙරවාද සම්ප්‍රදාය විසින් චුති-පටිසන්ධි විග්‍රහ කිරීමේ දි පිළිගත් මතය අනුවය ලෝභ මූලික සිත් මුලින් ම දක්වා ඇත්තේ. අභිධර්මයේ චිත්තවීථිවල ඉගැන්වෙන ආකාරයට සත්වයෙකුගේ ප්‍රතිසන්ධියට අනතුරුව භවාංග සිත් 15ක් හෝ 16ක් ඇති වීමෙන් අනතුරුව උපදින්නේ මනෝද්වාරාවජ්ජන සිතකි. මේ සිතින් කෙරෙන්නේ තමන් උපන් නව භවය ආවර්ජනය කිරීමයි. එය තමන් උපන් භවය තේරුම් ගැනීමට දරන පළමු ප්‍රයත්නයක් ලෙස නම් කළ හැකි ය. ඉන් අනතුරුව භවය ප්‍රාර්ථනා කරන ලෝභ ජවන හතක් (භව නික්කන්තික ලොභ ජවන) ඇති වේ. කිසියම් නව ගතියක් හෙවත් ජීවිතයක් ලැබූ කාමාචර සත්වයෙක් දෝස මෝහ ආදි වෙනත් අකුසල් සිතක් හෝ අලෝභාදි කුසල් සිතක් පහළ කරගන්නට පෙර මෙම ලෝභ සිත් ඇති කරගන්නා හෙයින් මෙම සිත් ම පළමුවෙන් ම දක්වා තිබේ. ඇතැම් ආචාර්වරු මේ මතයට විරුද්ධවන්නේ ලෝභ මූලික සිතට පෙරාතුව

---

4 "මහග්ගත භූමියං උප්පජ්ජන්තම්පිහෙතං තත්ථ රූපධාතුයං පවත්තිවිපාකං දෙන්තම්පි එකන්තෙන කාමාවචරමෙවාති." බලන්න. **අභිධම්මත්ථවිකාසිනී නාමා අභිධම්මාවතාර ටීකා** (සංස්. පොල්වත්තේ බුද්ධදත්ත ථෙර), ඇස්. කේ. චන්දතිලක, 1961. 83

රූපාවචර බ්‍රහ්මලෝකයේ ඇති විමන් පොකුණු ආදිය ද ඔවුන්ගේ රූපස්කන්ධය ද, රූපාවචර බ්‍රහ්මයන්ගේ සිත්වල හටගන්නා ලෝභ මූල මෝහ මූල චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, සම්පටිච්ඡන සන්තීරණ ආවජ්ජන හසිතුප්පාද මහා කුසල මහා ක්‍රියා චිත්තයෝ හා එම සිත්වල යෙදෙන චෛතසික ද අරූපාවචර බ්‍රහ්මයන්ගේ සන්තානයන්හි ඇති ලෝභ මූල මෝහ මූල මනෝද්වාරාවජජන මහාකුසල මහා ක්‍රියා චිත්තයෝ ද එම සිත් හා යෙදෙන චෛතසික සමූහය ද යන සියල්ල කාම තණ්හා විෂයට අයත් ව අවස්ථා කාම භූමි නම් වේ.

චිත්තවීථියේ මෙකී ලෝභ ජවන් සිත්වලට මුලින් මනෝද්වාරාවජ්ජන චිත්තක්ෂණයක් ද පහළ වන බැවිනි. මනෝද්වාරාවජ්ජන සිත ලෝභාදි හේතු රහිතව උපදින හෙයින් අහේතුක සිත්වල ඇතුලත් කරන ලද සිතකි. එම මතයට අනුව මුලින් ම ඇතිවන සිත ලෝභ මූලික සිතක් නොව අහේතුක සිතකි. කෙසේ නමුත්, ලෝභ සිත චිත්ත චෛතසික ධර්මයන් හටගැනීමෙහි ලා හේතු වශයෙන් ප්‍රත්‍ය වූ හේතුවක් වන එනිසාම සත්වයාගේ සසර පැවැත්මට අතිශයින් බලපාන (වර්තමූලික) කාමාවචර සත්ව සන්තානයේ බහුල වශයෙන් යෙදෙන සිතක් නිසාද ලෝභ මූලික සිත්වලට ප්‍රමුඛත්වය දී තිබේ. අනතුරුව දෝස මූලික සිත් දක්වා ඇත්තේ ඒවා ලෝභ සිත් මෙන් ම දොස හා මොහ යන හේතු දෙකකින් යුක්තව පහළ වන නිසාත් ලෝභ සිත් මෙන් අනවරතයෙන් පහළ නොවන නිසාත් ය මොහ මූලික සිත් මොහය ම හේතු වශයෙන් ලැබ උපදින හෙයින් ඒක හෙතුක වන නිසා තුන්වෙනුව දක්වා ඇත ය යන්න ආභිධර්මික මතයයි.

## 5. අකුසල් සිත් පිළිබඳ ප්‍රත්‍යයන්ගේ විවිධතා

විඤ්ඤාණයේ කාර්යය දැනගැනීම හෙවත් විජානනයයි. එහෙත් චිත්ත යනු හුදෙක් දැනගැනීමම නොව අරමුණක් කෙරෙහි වන ඤාණනමය (Cognative) සහජාතමය (Conative), ආවේදනාත්මක හා (affective) ප්‍රතිචාරාත්මක (Emotional Response) ලක්ෂණයන් ගේ සමස්තයයි. අප කුසල් අකුසල් හෝ අව්‍යාකත (කුසල් හෝ අකුසල් නොවන) යනුවෙන් හඳුන්වන්නේ මෙම සමස්ත ක්‍රියාවලියේ ප්‍රතිචාරමය අංශයයි. සිත අරමුණකට ඇතිවන ප්‍රතිචාරයක් බවට පත්වන්නේ සිත හා සම්ප්‍රයුක්ත වන මානසික ධර්ම නිසා ය. සිත් හා යෙදෙන මේ සම්ප්‍රයුක්ත ධර්ම නම් පරමාර්ථ ධර්ම හා පරමාර්ථ නොවන ධර්මයෝ ය. මෙකී සම්ප්‍රයුක්ත ධර්ම කාමාවචර සත්වයාගේ වේදනා සංඥා හා සංස්කාර ස්කන්ධයන්ට අයත් ය.

සිතක් හොඳ හෝ නරක වශයෙන් හැඳින්විය හැක්කේ එම සිත් හා යෙදෙන මෙකී චෛතසික හා වෙනත් සම්ප්‍රයුක්ත ධර්ම අනුව බව ඉහතින් දක්වන ලදි. අකුසල් සිත් හා යෙදෙන චෛතසික අභිධර්ම ඇදුරන් විසින් වර්ග කර දක්වා තිබෙන අතර ඊළඟ කොටසේ ඒ පිළිබඳ විස්තර සහිතව සාකච්ඡා කර ඇත. සම්ප්‍රයුක්ත ධර්ම රහිතව කිසිදු සිතක් පහළ නොවේ. සිත් හා එකට උපදින, එකට නිරුද්ධ වන, එක ම අරමුණක එල්බගන්නා චෛතසික පනස් දෙකක් ගැන *අභිධම්මත්ථසංගහයේ* දක්වා ඇත.